ආසියාවේ පළවන එකම කතෝලික ළමා පුවත් පත

LP - QD / 21/ News/ 2012

ක්‍රි. ව. 2012 මැයි 21 සඳුදා
04 වෙළුම - 30 කලබ
සතිපතා පත්‍රය - පිටු 16
මිල රු 10.00

# ළමා ප්‍රදීපය



## ශුද්ධාත්ම ආගමනය

මෙවරත් මැයි මස 27 වැනිදා සමරමු

ළමා ප්‍රදීපය

ආරම්භය - 2008 ඔක්තෝබර් 06 සඳුදා

කොළඹ කතෝලික මුද්‍රණාලය, කොළඹ 08. / දුරකතන අංකය - 2695984 / 4899611
ෆැක්ස් : 2692586 - ඊ-මේල් pradeepaya@yahoo.com
වෙබ් අඩවිය - www.colombocatholicpress.lk

# ශුද්ධාත්මයාණන්ගේ මහ බලවේගයෙන් පුංචි ඔබ සන්නද්ධ විය යුතුමයි...

## ආදරණීය දුවේ පුතේ...

ශුද්ධාත්මයාණන් වහන්සේගේ වැඩම කිරීම සිහිපත් කරන්නට මේ දින වල ආධ්‍යාත්මිකව කිතුනු අපි සූදනම් වෙනවා. දහම් පාසලේ නිරන්තරයෙන්ම ඔබ හදරන ආකාරයට හා ශු. බයිබලයෙ සුබාරංචිය තුළින් කියවා හා මෙනෙහි කර ඇති ආකාරයට ක්‍රිස්තුන් වහන්සේගේ ස්වර්ගාරෝහණයෙන් පසුව ශ්‍රාවකයන් දේව මාතාවන් හා සමග සේනාකුළු ශාලාවේ, එක් රැස්වී, යාච්ඤා කරමින් බියෙන් සිටි බැව් මතකයි නේද?

එලෙස එම ශ්‍රාවකයන් ක්‍රිස්තුන් වහන්සේගේ මරණයෙන් පසුව බියෙන් වෙළී මුළු ගැන්වී ජීවත් වූයේ ඇයි යන ප්‍රශ්නය ඇසීම සාධාරණයි. මන්ද එවිට ඔවුන්ගේ සියළු අපේක්ෂා හීන වෙමින් පැවති බව හොඳින්ම පෙනෙන නිසා.

මෙතනදී අපි තවත් දෙයක් මතකයට ගත යුතුයි. ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ මරණයෙන් පසු උත්ථාන සමයේ දින 40 ක් පුරා ඔවුන් වහන්සේ තම ශ්‍රාවකයන්ට විටින් විට පෙනී සිටිමින් කතා කළා. ඔවුන්ව දැනුවත් කළා. මිලාන වූ ඔවුන්ගේ චිත්ත ශක්තිය පණ ගන්වන්නට කටයුතු කළා. පසුව එවන සහනදායකයාණන් වහන්සේ ගැන පුන පුනා ක්‍රිස්තුන් වහන්සේ තමන් වහන්සේගේ ශ්‍රාවකයන් සමග කතා කළත් එය තේරුම් ගන්නට තවම ඔවුන් ශක්තියක් ලබා තිබුනේ නැහැ.

ආදර දුවේ පුතේ, ස්වාමීන් වහන්සේගේ ශ්‍රාවතයන් එතරම් දැන උගත් පිරිසක් නොවන බව ශු. බයිබලයම සාක්ෂි දරනවා. ඒ වගේම ඔවුන් සමාජයේ ධනයෙන් සහ බලයෙන්ද ශක්තිමත් නොවූ පිරිසක්. ඉතින් මේ වගේ කණ්ඩායමක් තුළ ක්‍රිස්තුන් වහන්සේගේ කුරිරු මරණය සියැසින් දැක තිබීමත් නිසා බිය ඇතිවීම සාධාරණයි නේද? ශාරීරික පීඩාව වගේම මානසික පීඩාව තුළත් මේ ශ්‍රාවකයන් විශාල ලෙස දුර්වල වී සිටින්නට ඇති.

එනමුත් ආදර දුවේ පුතේ, මේ දුර්වල භාවය තුළ වුනත් ඔවුන් සැබවින්ම විශ්වාසය තබා තිබූ ප්‍රධාන කරුණක් තිබුනා. ඒ තමයි, තම ස්වාමියාණන් තමන්ට පවරා තිබූ ඒ මහා කාර්යය පිළිබඳ මතකය. ක්‍රිස්තු පණිවුඩය ලොව පුරා පැතිරවීමට හා ක්‍රිස්තු අනුගාමිකයන් පෝෂණය කිරීම වැනිදෑ ඔවුන්ගේ මතකයේ රැඳී තිබුනත්, තමන්ගේ බියසුළුගතිය තමන්ගෙ ඉදිරි ගමන අඩපණ කරවනු ඔවුනට වැටහි තිබුණා. එමෙන්ම ජුදෙව් සමාජය වැදගත් සමාජ තත්ත්වයක් තුළ වැජඹෙමින් ඉටු කළ කාර්යයන් තුළ ධීවරයන් හැටියට ශ්‍රාවකයන් තමන්ගේ ඉදිරි ගමන පිළිබඳව තවත් අවිනිශ්චතව සිටින්නට ඇති.

නමුත් ආදර දුවේ, පුතේ පෙන්තකොස්ත දිනයේදී ඒ කියන්නේ ක්‍රිස්තුන් වහන්සේ මළවුන්ගෙන් උත්ථාන වී දවස් පනහකට පසු ඔවුන් රැස්ව සිටි සෙනාකුළු ශාලාව හරහා සැඩ සුළඟක් හමන්නාක් මෙන් ඔවුනට දැනුනා. මුළු ශාලාව එයින් පිරිගිය අතර ගිනිදළු දිවක හැඩයක් ඔවුන් එකිනෙකා මත තිබෙනු පෙනුනා. (බලන්න අද ළමා ප්‍රදීපයේ කවරයේ පින්තූරය) ''ඔවුන් මත ශුද්ධාත්මයාණෝ වැඩම කළහ'' මෙන්න ඔවුනට දැනුන වෙනස. ඉන් පස්සේ සිදුවුයේ ඉතා විශ්මය ජනක සිදුවීම් මාලාවක්. තමනට අවශ්‍ය පරිනතභාවය , එඩිතර ගතිය, ඔවුන් තුළට කා වැදී යන තත්ත්වයක් දැනුනා.

ආදර දුවේ, පුතේ, පෙන්තකොස්තය ජුදෙව් සංස්කෘතියෙහි ඉතා වැදගත් උත්සවයක්, ආරම්භයේදී කෘෂි ආර්ථිකයක් තුළ මෙම ජුදෙව් ජාතිකයන් පෙන්තකොස්තය මහා ඉහළින් සැමරුවා. එවන් දවසකම ශුද්ධාත්මයාණන් වැඩම කිරීමත්, ඒ තුළින් ශ්‍රාවකයනට නව පණක් දීමත් කිතුනු අපේ අධ්‍යාත්මයට ඉතා වැදගත් සිදුවීම්. ජ්වලිතකමට, ආගමික අවදිවීමකට භාජනය වුනු ශ්‍රාවකයන් තුළ තිබූ බියගුළු ගතිය සැනෙකින් පහවී ගියා. පාස්කු මංගල්‍යය සඳහා ජෙරුසලමට එක් රැස්වූ ජනතාව අතර නොයෙක් භාෂාවන් කතා කරන්නන් සිටියා. ශුද්ධාත්මයාණන්ගෙන් පිරිගිය මේ ශ්‍රාවකයන් ඔවුන් ලැබූ කතා ශක්තිය අනුව කතා කරනු ඇසූ ඒ ජනතාව ''අපේම භාෂා වලින් දෙවියන් වහන්සේගේ බලවත් ක්‍රියා ගැන ඔවුන් කතා කරන්නේ යැ''යි කියන්නට පටන් ගත්තා.

නව පෙන්තකොස්තයේ පුදුමාකාර ප්‍රාතිහාර්යයවුයේ මෙයයි. පෙන්තකොස්තයේ ප්‍රාතිහාර්යය විශේෂ ශුද්ධාත්ම වරමක්මයි. ධර්මදානය යන්නෙහි මූලික හරය මෙම ප්‍රාතිහාර්යය තුළ ගැබ්වී තිබෙනු පැහැදිලිව පෙනී යනවා. දේව වචනය, මිනිස් හදවත කරා ගෙන යනු වස් භාෂාව හෝ සංස්කෘතිය හෝ බාධකයක් නොවූ බව මෙම පළමු ප්‍රාතිහාර්යයෙන්ම පෙනී යනවා.

ආදර දුවේ පුතේ, පළමු ක්‍රිස්තියානි සභාවේ නායකයා ලෙස පේදුරු තුමා එතුමන්ගේ සහෝදර ශ්‍රාවකයන්ද සමග ශුද්ධාත්මයාණන්ගෙන් පිරි ක්‍රිස්තුන් වහන්සේ තමන්ට පැවරූ කාර්යය ඉටු කිරීමට එඩිතරව පියවර එසවූවා. ඔවුන් වහන්සේගේ කීර්ති ඝෝෂාව පවසන්නට ඉදිරියටම ගියා.

අපත් එලෙස ඉදිරියට යායුතුයි, ක්‍රිස්තු ශ්‍රාවකයන් හැටියට නොබියව ශුද්ධාත්ම ආනුභාවයෙන් පිරි සුබාරංචිය ප්‍රකාශ කරන්නට එඩිතර විය යුතුයි. පුංචි ඔබ හෙට දවසේ ශුද්ධවූ සභා නායකයන් බවට පත්වන්නේ මේ සාක්ෂ්‍ය දැරීම ශුද්ධාත්ම සත් වරමින් පිරි අර්ථවත් කරන හැටියටයි. ඔබට එය කළ හැකියි. එකට බැඳෙමින් මේ ක්‍රිස්තු ශ්‍රාවකත්වය විහිද හරින්නට ශුද්ධාත්ම ආනුභාවයෙන් පූර්ණ වන්න.

**ඔබ සැමට ජේසු පිහිටයි !**

සංස්කාරක

**ගරු ශාන්ත සාගර හෙට්ටිආරච්චි පියතුමා**

# නාත්තන්ඩිය දේවස්ථානයට අයත් සියලු දහම් පාසල් ළමුන්ට ලේඛක වැඩමුළුවක්

ළමුන්ගේ ලේඛක කුසලතා ඔප්නැංවීමේ අරමුණින් යුතුව පැවැත්වෙන ළමා ලේඛක වැඩමුළුවක් 2012 මැයි මස 27 වන ඉරුදින නාත්තන්ඩිය ලූර්දු දේව මාතා සිද්ධස්ථානයේ දී පැවැත්වේ. මෙය මෙහෙයවනු ලබන්නේ ළමා ප්‍රදීපය සහය සංස්කාරක, දේශක කුමර නයනජිත් මහතා විසිනි.

මෙම වැඩමුළුවට නාත්තන්ඩිය ලූර්දු දේව මාතා , වලහපිටිය සා. ආනා , දුන්කන්නාව සා. ජුඩ්, තල්ගස්අගාර සා. ප්‍රැන්සිස් සේවියර්, සාගරගම සා. බ්ලාසියුස් යන දහම් පාසල් හි 6 ශ්‍රේණියේ සිට ඉහළ ළමෝ සහභාගී වෙති.

නාත්තන්ඩිය සිද්ධස්ථාන පාලක ගරු පීටර් උපාලි චර්විල් සහයක ගරු දුමින්ද සුරේෂ් යන පියතුමන්ලාගේ අනුශාසකත්වයෙන් හා දහම් ගුරුවරුන්ගේ සහයෝගයෙන් මෙය සංවිධානය කෙරේ.

**තරංගා ප්‍රභාෂිණි - නාත්තන්ඩිය**

# මුද්දර ලෝකය හඳුනා ගනිමු



**ඉදිරිපත් කිරීම :- සිරිල් පෙරේරා - මල්කඩුවාව**

**(පසුගිය ලිපිය හා සබැඳේ)**

තැපැල් සේවාව ආරම්භ වූ මුල් කාලයේදී රාජකීයන්ට, ප්‍රභූවරුන්ට, ධනවතුන්ට, බලවතුන්ට මෙන් ම ආගමික නායකයන්ට සීමා වූ තැපැල් සේවාව මෙම මුද්දරය නැමති කුඩා කොළ කැබැල්ලේ අවතීරණයත් සමග මහා විප්ලවයක් කරමින් දුප්පත් පොදු ජනතාව වෙතටත් එම සේවාව අත්පත් කර දුන්නේ ය. එම ශ්‍රේෂ්ඨ විප්ලවවාදියා බ්‍රිතාන්‍ය ජාතික ශ්‍රීමත් ජෙලන්ඩ්හිල් ය. ඔහු අපේ "මුද්දර පියා " ලෙස පිළිගැනේ.

එවකට යමෙකුට ලිපියක් ලබා ගැනීම සඳහා ගාස්තුවක් ගෙවිය යුතුව තිබිණි. එම ගාස්තුව තීරණය වුයේ එම ලිපියේ අඩංගු පිටු ගණන හා තැපැල්කරු විසින් එය රැගෙන ආ දුර ප්‍රමාණය අනුවයි. එලෙස එම තැපැල් ගාස්තුව වැඩි මිලක් වු විට ලබන්නා විසින් එම ලිපිය ප්‍රතික්ෂේප කිරීම නිරන්තරයෙන් සිදු විය.

එය තැපැල් සේවයටද බරපතළ ප්‍රශ්නයක් වූ නිසා ලිපියේ බර හා යවන දුර ප්‍රමාණය අනුව යවන්නා විසින් ම තැපැල් ගාස්තුව ගෙවීමටත් එම ගාස්තුවට සරිලන මුද්දර ප්‍රමාණයක් ලිපියේ ඇලවීම සුදුසු බවය ශ්‍රීමත් රෝලන්ඩ් හිල්ගේ "මුද්දරය" හඳුන්වා දීමේ පරමාර්ථය වුයේ. එය කෙතරම් දුරට සාර්ථක ඵල නෙළා තිබේ ද යන්න මුද්දර ලෝලී ඔබ සැම අද හොඳින් දන්නා බව අපි දනිමු.

ලොවේ එකල ජනප්‍රිය ම විනෝදාංශය වූයේ කුරුළු පිහාටු එකතු කිරීම යි. ප්‍රථම මුද්දරය නිකුත් වී වසරක් ඇවෑමෙන් එනම් 1841 දී ලන්ඩනයේ "ද ටයිම්ස්" පුවත්පතේ කාන්තාවක් විසින් තම නිවසේ තම බිත්ති සැරසිල්ලක් නිර්මාණය කිරීම සඳහා මුද්දර අවශ්‍ය බව දැන් වීමක් පළ කළාය. එමගින් ඇයට කෙටි කලකින්ම පැන්ස 2 මුද්දර 10,000 ක් පමණ ලැබුණු බව සඳහන් වේ. එනමුත් විනෝදාංශයක් වශයෙන් මුද්දර එකතු කිරීම ඇරඹූ ලොව ප්‍රථම පුද්ගලයා වන්නේ ලන්ඩනයේ විසූ "දොස්තර ජෝන් එඩ්වඩ් ග්‍රේ" බව පිළිගැනේ.

මුද්දර එකතු කිරීම හා ඒ පිළිබඳව අධ්‍යයනය කිරීමේ විනෝදාංශය "ෆිලටලි " යනුවෙන් හැඳින්වේ. එය ග්‍රීක වදනකි. ආදරය අය කිරිමකින් තොර යන පද දෙක එක් කරමින් "ෆිලටලි " යන වචනය ප්‍රංශ ජාතික ජෝර්ජ් හර්පින් 1864 දී ලොවට හඳුන්වා දුනි. එහි නියම අර්ථය වන්නේ " ගෙවීමකින් තොරව ලැබෙන ආදරය" යන්නයි. "ෆිලටලි " යන වදන සඳහා පරිභාෂිත සිංහල වචනය "පහිනස"යි.

**ඉදිරි කලාපයේදී ශ්‍රී ලංකාවේ නත්තල් මුද්දර ඉතිහාසය පිළිබඳව දැන ගනිමු.**